

# අ.පො.ස. උසස්පෙළ ආර්ථික විද්‍යාව විෂයය

## ආර්ථික වර්ධනය, ආර්ථික සංවර්ධනය, සංවර්ධනය

## දරිද්‍රතා සංකල්පය








ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය : ආචාර්ය සරත් කටුකුරුන්ද

ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලය

**katuku@econ.ruh.ac.lk**




" අධ්‍යාපනය නම් ශාකයේ මූලය තිත්ත නමුත් එහි ඵල ඉතා ප්‍රණීතය"

-ඇරිස්ටෝටල්-

නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.

නිපුණතා මට්ටම 11.1 : ආර්ථික වෘද්ධියේ වැදගත්කම අගය කරමින් ආර්ථික වර්ධනයට ඉවහල් වන සාධක විශ්ලේෂණය කරයි.

කාලච්ඡේද ගණන : 08

ඉගෙනුම් පල :

- ආර්ථික වෘද්ධිය අර්ථකථනය කරයි.
- ආර්ථික වෘද්ධිය මැනීම සිදු කරන ආකාරය විස්තර කරයි.
- ආර්ථික වෘද්ධිය තීරණය වන සාධක පෙන්වා දෙයි.
- ආර්ථික වෘද්ධියේ වැදගත්කම පැහැදිලි කරයි.
- ආර්ථික වෘද්ධියේ පිරිවැයක් පවතින බව නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික වෘද්ධි ප්‍රවණතා පැහැදිලි කරයි.
- වෘද්ධි ක්‍රියාවලිය ජය ගත් රටවල පොදු ලක්ෂණ විග්‍රහ කරයි.

නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.

නිපුණතා මට්ටම 11.2 : සංවර්ධනය ආශ්‍රිත විවිධ සංකල්ප විග්‍රහ කරයි.

කාලච්ඡේද ගණන : 08

ඉගෙනුම් පල :

- ආර්ථික සංවර්ධනය අර්ථ දක්වයි.
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක දී ආර්ථික ව්‍යුහයේ ඇති වන වෙනස්කම් විස්තර කරයි.
- සංවර්ධන සංකල්ප අර්ථ දක්වයි.
- සංවර්ධනයේ පැතිකඩ විග්‍රහ කරයි.
- ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය අතර වෙනස සසඳයි.
- මානව සංවර්ධනය අර්ථ දක්වයි.
- තිරසර සංවර්ධනයේ පැතිකඩ විග්‍රහ කරයි.
- සංවර්ධනය ආශ්‍රිත නව ප්‍රවණතා විග්‍රහ කරයි.

නිපුණතාව 11.0 : සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.

නිපුණතා මට්ටම 11.3 : සංවර්ධනය මිනුම් කිරීමේ දර්ශක පෙළගස්වමින් සංයුක්ත දර්ශක පිළිබඳ ව විමර්ශනය කරයි.

කාලච්ඡේද ගණන : 08

ඉගෙනුම් පල :

- සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශක පෙළ ගස්වයි.
- සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල වැදගත්කම හා අඩුපාඩු අනාවරණය කරයි.
- ඒකපුද්ගල ආදායම පදනමක් ලෙස යොදා ගෙන ලෝක බැංකුව ආර්ථික වර්ගීකරණය කරන ආකාරය ඉදිරිපත් කරයි.
- සංවර්ධනය මැනීම සඳහා සංයුක්ත දර්ශක නම් කරයි.
- මානව සංවර්ධන දර්ශක හඳුන්වයි.
- මානව සංවර්ධන දර්ශකය සකස් කිරීමට යොදා ගැනෙන සංරචක නම් කරයි.
- මානව සංවර්ධන දර්ශකය මත පිහිටා රටවල් වර්ග කරන ආකාරය දක්වයි.
- මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා හා දුබලතා පෙන්වා දෙයි.
- මානව සංවර්ධනයෙහි ලා ශ්‍රී ලංකාව අත්පත් කර ගත් ප්‍රගතිය අනාවරණය කරයි.
- සන්තුෂ්ටි දර්ශකය හඳුන්වයි.
- එහි සංරචක විස්තර කරයි.

"Information is the root of everything we do"

"Information gives you the power to make the right decisions"


## තොරතුරු මූලාශ්‍ර හා දත්ත සම්පාදනය කර ගැනීම.

- ශ්‍රී ලංකා මහ බැංකුව
- www.cbsl.gov.lk

- ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
- www.statistics.gov.lk

- ලෝක බැංකුව
- www.worldbank.org

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ,
- www.undp.org


Human Development Report 2020
The next frontier
Human development and the Anthropocene
U N
D P

# මහ බැංකු වාර්ෂික වාර්තා හා අදාළ අනෙකුත් ප්‍රකාශන භාවිත කිරීම.

- සටහන සඟරාව
- ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත
- මූලික ආර්ථික දර්ශක
- විශේෂ සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටය
- මූලික සමාජ දර්ශක

## ලෝක බැංකුව
## ඒක පුද්ගල දළ ජාතික ආදායම අනුව රටවල් පහත ආකාරයට වර්ග කර ඇත- 1 July 2022

*අඩු ආදායම් ලබන රටවල්* (Low Income Countries) *ඇමරිකන්* **ඩොලර් 1,085 හෝ ඊට අඩු**

*මැදි ආදායම් ලබන රටවල්* (Middle Income Countries) *ඇමරිකන්* **ඩොලර් 1,086 – 13,205**

*ඉහළ ආදායම් ලබන රටවල්* (High Income Countries) **ඇමරිකන් ඩොලර් 13,206 හෝ ඊට වැඩි**

*පහළ මැදි ආදායම් ලබන රටවල්* (Lower Middle Income Countries) *ඇමරිකන්* **ඩොලර් 1,086 -4,255**

*ඉහළ මැදි ආදායම් ලබන රටවල්* (Upper Middle Income Countries) *ඇමරිකන්* **ඩොලර් 4,256- 13 ,205**

## ලෝක බැංකුව
## ඒක පුද්ගල දළ ජාතික ආදායම අනුව රටවල් පහත ආකාරයට වර්ග කර ඇත- 1 July 2021

*අඩු ආදායම් ලබන රටවල්* (Low Income Countries) *ඇමරිකන්* ***ඩොලර් 1,045 හෝ ඊට අඩු***

*මැදි ආදායම් ලබන රටවල්* (Middle Income Countries) *ඇමරිකන්* ***ඩොලර් 1,046 – 12,695***

*ඉහළ ආදායම් ලබන රටවල්* (High Income Countries) ***ඇමරිකන් ඩොලර් 12,696 හෝ ඊට වැඩි***

*පහළ මැදි ආදායම් ලබන රටවල්* (Lower Middle Income Countries) *ඇමරිකන්* ***ඩොලර් 1,046 -4,095***

*ඉහළ මැදි ආදායම් ලබන රටවල්* (Upper Middle Income Countries) *ඇමරිකන්* ***ඩොලර් 4,096- 12,695***

LIC- 27 LMIC- 55 UMIC- 55 HIC- 80

***ඩොලර් 3582***

## ලෝක බැංකුව
## ඒක පුද්ගල දළ ජාතික ආදායම අනුව රටවල් පහත ආකාරයට වර්ග කර ඇත- 1 July 2020

*අඩු ආදායම් ලබන රටවල් (Low Income Countries) ඇමරිකන්* **ඩොලර් 1,036 හෝ ඊට අඩු**

*මැදි ආදායම් ලබන රටවල් (Middle Income Countries) ඇමරිකන්* **ඩොලර් 1,036 – 12,535**

*ඉහළ ආදායම් ලබන රටවල් (High Income Countries)* **ඇමරිකන් ඩොලර් 12,535 ට වැඩි**

*පහළ මැදි ආදායම් ලබන රටවල් (Lower Middle Income Countries) ඇමරිකන්* **ඩොලර් 1,036 -4045**

*ඉහළ මැදි ආදායම් ලබන රටවල් (Upper Middle Income Countries) ඇමරිකන්* **ඩොලර් 4,046- 12,535**

## *Economies moving to a higher income group*

| Economy | New group | Previous group | 2021 GNI/ capita as of July 1, 2022 | 2020 GNI/ capita as of July 1, 2021 |
|---|---|---|---|---|
| Belize | Upper-middle income | Lower-middle income | 4,290 | 3,970 |
| Panama | High income | Upper-middle income | 14,010 | 11,880 |
| Romania | High income | Upper-middle income | 14,170 | 12,570 |

Economies moving to a lower income group

| Economy | New group | Previous group | 2021 GNI/ capita as of July 1, 2022 | 2020 GNI/ capita as of July 1, 2021 |
|---|---|---|---|---|
| Lebanon | Lower-middle income | Upper-middle income | 3,450 | 5,510 |
| Palau | Upper-middle income | High income | 12,250 | 14,560 |
| Zambia | Low income | Lower-middle Income | 1,040 | 1,190 |

## *ආර්ථික වර්ධනය මත සංවර්ධන සංකල්පය අර්ථ විග්‍රහ කිරීම.*

1940 ගණන්වල අගභාගයේ **සංවර්ධනය ලෙස හඳුනා ගෙන ඇත්තේ ආර්ථික වර්ධනය හෙවත් ආර්ථික වෘද්ධියයි.** එහි දි යම් රටක මූර්ත දළ දේශීය/ ජාතික නිෂ්පාදිතය වාර්ෂිකව ඉහළ නංවා ගනිමින් දිගුකාලයක් පුරා එය පවත්වා ගැනීමට අදාළ රටේ ජාතික ආර්ථිකයට පවතින හැකියාවය. ඒ අනුව මූර්ත දළ දේශීය/ ජාතික නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය හෝ ප්‍රතිශීර්ෂ මූර්ත දළ දේශීය/ ජාතික නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය පදනම් කර ගනිමින් සංවර්ධනය අර්ථ විග්‍රහ කොට එය මිනුම් කිරිමට උත්සුක වී ඇත. මෙයින් පැහැදිලි වන්නේ **සාම්ප්‍රදායික අර්ථ විග්‍රහ කිරීම අනුව සංවර්ධනය සඳහා ආදේශකයක් ලෙස ආර්ථික වර්ධනය සැලකිල්ලට ගෙන ඇති බවයි.**

ආර්ථික වර්ධනය යන සංකල්පය මගින් නිරූපණය කෙරෙන්නේ ප්‍රමාණාත්මක පැතිකඩකි. එහි දි රටක නිෂ්පාදන ධාරිතාවය හෙවත් විභව නිමවුම (Potential Output) ඉහළ යාම මගින් ආර්ථික වර්ධනය අර්ථවත් වන අතර එය අදාළ රටේ මූර්ත ජාතික නිෂ්පාදිතයේ හෝ ඒක පුද්ගල මූර්ත නිෂ්පාදිතයේ සිදුවන අඛණ්ඩ ඉහළ *යාමක් මගින් එය තවදුරටත් හඳුනා ගත හැකි වේ.*

# ආර්ථික වර්ධනය සහ සංවර්ධනය

***ආර්ථික වෘද්ධිය හා ආර්ථික වෘද්ධි අනුපාතය***

- ආර්ථිකයක භාණ්ඩ සහ සේවා නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමවුම අඛණ්ඩව ප්‍රසරණය වීම ආර්ථික වෘද්ධිය වේ. මූර්ත නිමවුම දිගු කාලයක් මුළුල්ලේ ප්‍රසාරණය වීමයි.

- ආර්ථිකයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පිළිබඳ ප්‍රමාණාත්මක වෙනස් වීමක් නිරූපණය වේ.

- වාර්ෂික ප්‍රතිශතාත්මක වෘද්ධි අනුපාතිකය ආශ්‍රයෙන් ආර්ථික වෘද්ධිය ගණනය කෙරේ.

- මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ හෝ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ හෝ ප්‍රතිශතාත්මක වර්ධනයක් මගින් ආර්ථික වෘද්ධිය මිනුම් කළ හැකිය.

- කිසියම් කාලපරිච්ඡේද දෙකක් අතර මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි හෝ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයෙහි හෝ වෙනස (වැඩිවීම හෝ අඩු වීම) ප්‍රතිශතාත්මකව දැක්වීම ආර්ථික වෘද්ධි අනුපාතිකය වේ.

- යම් ආර්ථිකයක නිමවුමේ හටගත් සැබෑ වෙනස්වීම පමණක් ආර්ථික වෘද්ධි අනුපාතිකයෙන් මිනුම් කෙරේ.

- ආර්ථිකයේ විභව නිෂ්පදාන ධාරිතාවේ ප්‍රසාරණය ආර්ථික වෘද්ධිය වේ.

## ▪ආර්ථික වෘද්ධිය හා වෘද්ධි අනුපාතය

(Economic growth and Economic growth rate)

සළකා බලනු ලබන පෙර වර්ෂයකට සාපේක්ෂව පසු වර්ෂයේ රටක මූර්ත නිමැවුම කොපමණ ප්‍රතිශතයකින් වෙනස්වී ඇත්දැ යන්න ආර්ථික වෘද්ධි අනුපාතය මගින් මිනුම් කෙරේ

$$EGR = \frac{RGDP_n - RGDP_{n-1}}{RGDP_{n-1}} \times 100$$

$$EGR_{2020} = \frac{RGDP_{2020} - RGDP_{2019},}{RGDP_{2019}} \times 100 = \frac{9,530,606 - 9,883,350}{9,883,350} \times 100 = \mathbf{-3.57\%}$$

# ආර්ථික වෘද්ධිය නිර්වචනය කිරීම

- ආර්ථික වෘද්ධිය යන්නෙන් සැබැවින් ම අදහස් කෙරෙනුයේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේලා ආර්ථිකය සතු ධාරිතාව ප්‍රසාරණය වීමකි

- ආර්ථික විද්‍යාඥයෝ ආර්ථික වෘද්ධිය මිනීම සඳහා ක්‍රම දෙකක් භාවිතා කරති. එනම් කාලයත් සමග (i) මූර්ත දළ ජාතික නිෂ්පාදිතයෙහි හෝ ශුද්ධ ජාතික නිෂ්පාදිතයෙහි හටගන්නා වැඩිවීම හා (ii) කාලයත් සමග ප්‍රති ශීර්ෂ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයෙහි මූර්ත ශුද්ධ ජාතික නිෂ්පාදිතයෙහි හට ගන්නා වැඩි වීම මගිනි.

## ආර්ථික වර්ධනයට දායක වන සාධක (වෘද්ධියේ මූලාශ්‍ර)

## 1. සම්පත් සම්භාරය ඉහළ යාම

- භෞතික ප්‍රාග්ධනය වැඩිවීම

(භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන උපකරණ හා ඉදිකිරීම් වැනි දෑ)

- මානව ප්‍රාග්ධනය වැඩි වීම

(අධ්‍යාපනය, පුහුණුව සහ අත් දැකීම් මගින් ලබා ගන්නා දැනුම හා නිපුණතාවන්)

- ස්වභාවික ප්‍රාග්ධනය වැඩි වීම

(භූමිය, ගංගා, ඇළදොල, ඛනිජ සම්පත් වැනි ස්වභාවික ධර්මයේ දායාද වශයෙන් ලැබී ඇති නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන සම්පත්)

- සමාජ ප්‍රාග්ධනය වැඩිවීම (ප්‍රජාවගේ පොදු ප්‍රශ්න විසදා ගැනීම සඳහා පුද්ගලයන් අතර ඇති සම්බන්ධතා ජාල අන්‍යෝන්‍ය විශ්වාසය සහ ප්‍රතිමාන යනාදිය)

**2.ඵලදායිතාව ඉහළ යාම**

- තාක්ෂණික දියුණුව
- කළමනාකරණය දියුණු වීම
- නවයතාවන් බිහි වීම
- පර්යේෂණ හා සංවර්ධනය සඳහා කෙරෙන ආයෝජන වැඩිවීම
- යහපත් ආකල්ප හා ප්‍රතිමාන

**3 ආර්ථික ස්ථායිතාව**

**4 ව්‍යසායකත්වයේ වර්ධනය**

**5 සානුබල (ප්‍රෝත්සාහ) පැවැතීම**

**6 දේශපාලන හා සමාජ ස්ථාවරත්වය**

**7 යහපාලනය**

**8 ආර්ථික නිදහස**

**9 සානුබල පැවැතීම**

**10 අබාධ වෙළෙඳාම සහ ආයෝජන ඉහළ යාම.**


යම් රටක මූර්ත නිමැවුම (Real Output) වැඩිකර ගැනීම සඳහා නිෂ්පදන ධාරිතාව පුළුල් කරනු ලබන අඛණ්ඩ ක්‍රියාවළිය ආර්ථික වර්ධනය ලෙස අදහස් කෙරේ.

මූර්ත දළ දේශීය නිෂ්පාදනයේ අඛණ්ඩ ඉහළ යාම
(Real Gross Domestic Product-RGDP)

මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ අඛණ්ඩ ඉහළ යාම
(Real Gross National Product-RGNP)

මූර්ත ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ අඛණ්ඩ ඉහළ යාම
(Real GDP  Per Capita)

මූර්ත ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයේ අඛණ්ඩ ඉහළ යාම
(Real GNP  Per Capita)





[illegible]


- රූප සටහනෙහි දැක්වෙන ආකාරයට A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය කරා ආර්ථිකය ප්‍රසාරණය කරනු ලැබුව හොත්, එහි දී සිදුව ඇත්තේ නිෂ්පාදන ධාරිතාවයෙහි හෝ විභව නිමැවුමෙහි ප්‍රසාරණයක් නොව, ආර්ථිකය ප්‍රයෝජනයට නොගත් ධාරිතාව උපයෝජනය කරමින් නිමැවුම වැඩිකර ගැනීමකි.


- තාක්ෂණිකව බලන විට A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍යය දක්වා නිෂ්පාදනය වැඩි කර ගන්නා විට ආර්ථික වර්ධනයක් හට නොගනී. මන්දයත්, විභව නිමැවුමෙහි ප්‍රසාරණයක් සිදුවී නොමැති බැවිනි.

- අනෙක් අතට, එම ආර්ථිකය B ලක්ෂ්‍යයේ සිට C ලක්ෂ්‍යය කරා ළඟා වන විට, ආර්ථික වර්ධනය ක්‍රියාත්මකව හට ගනී. එහි දී ආර්ථිකයේ විභව නිමැවුම් මට්ටම ද PPF1 සිට PPF2 දක්වා ප්‍රසාරණය වී ඇත.



y
p1
p
2010
2000
0
p
p1
x








ආර්ථික වෘද්ධිය : නිෂ්පාදන හැකියා පර්යන්තය විතැන් වීම

ආර්ථික වෘද්ධිය : සමාහාර සැපයුම් වක්‍රය විතැන් වීම

- නිෂ්පාදන හැකියා පර්යන්තය PPF1 සිට PPF2 දක්වා පිටතට විතැන් වීමක් මගින් ආර්ථික වෘද්ධිය ක්‍රියාවලිය නිරූපණය කළ හැකිය.

- සමාහාර ඉල්ලුම් සැපයුම් ආදර්ශය තුළින් ආර්ථික වෘද්ධිය පෙන්නුම් කෙරෙනුයේ ආර්ථිකයේ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන් වීම මගිනි. ආර්ථිකයේ විභව නිමවුම් මට්ටමේ වැඩිවීම මේ මගින් පෙන්නුම් කෙරේ.




මිල මට්ටම
Price Level
LRAS1
LRAS2
SRAS1
SRAS2
වර්ෂ 10
පිරිවැය පහත වැටීම
ආර්ථික වර්ධනය
0
RGDP1
RGDP2
මූර්ත දළ දේශීය නිපාදිතය
Real Gross Domestic Product

43. ආර්ථික වෘද්ධිය වඩාත් හොඳින් විස්තර කෙරෙනුයේ,

(1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන්වීමක් සහ ස්වභාවික සේවා වියුක්ති අනුපාතිකය ඉහළ යාමක් ලෙස ය.
(2) නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන්වීමක් සහ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන්වීම ක් ලෙස ය.
(3) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන්වීමක් සහ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන්වීමක් ලෙස ය.
(4) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන්වීමක් සහ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන්වීම ක් ලෙස ය.
(5) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන්වීමක් සහ දිගු කාලීන සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම ක් ලෙස ය.

# Economic Growth



# ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ

- ඉහළ ජීවන තත්ත්වයක් ලබාගත හැකි වීම (දරිද්‍රතාවය අඩු වීමට මග පෙන්වීම)
- සේවා නියුක්තිය ඉහළ යාම
- ඒක පුද්ගල ආදායම ඉහළ යාම
- ව්‍යාපාරික විශ්වාසනීයත්වය ඉහළ යාම
- මිල ස්ථායිතාවය පවත්වාගත හැකි වීම
- ව්‍යාපාරවලට ඉහළ ලාභ අත්කර ගත හැකි වීම
- අයවැය හිගය අඩු වීම
- ගෙවුම් ශේෂය ශක්තිමත් වීම
- හිගකම පිළිබඳ ප්‍රශ්නය ලිහිල් වීම.

# ආර්ථික වර්ධනයේ පිරිවැය

- ආදායම් සහ ධන ව්‍යාප්තියේ විෂමතා ඇති වීම
- ශ්‍රමයේ සේවා වියුක්තියක් ඇති වීම
- ප්‍රාදේශීය විෂමතා ඇති වීම
- තිරසාර සංවර්ධනයට හානිකර වීම
- උද්ධමනයක් ඇති වීමේ අවදානම
- ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම
- නිෂ්පාදනය හා පරිභෝජනය ඉහළ යාම තුළින් පරිසරයට අහිතකර ලෙස බලපෑම
- ආවස්ථික පිරිවැය

# ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීමට යෝග්‍ය ප්‍රතිපත්ති

- සම්පත් සම්භාරය හා ඵලදායිතාවය ඉහළ නැංවීමට හේතුවන සාධක මත පදනම් වේ.

(i) ඉතුරුම් හා ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.

(ii) දේපොළ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ දේශපාලන ස්ථාවරත්වය

(iii) විදේශ ආයෝජන දිරිමත් කිරීම.

(iv) මානව ප්‍රාග්ධනය සඳහා ආයෝජනය කිරීම.

(v) බදු පහළ හෙළීම සහ නියාමනය ලිහිල් කිරීම.

(vi) පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම

(vii) අබාධ වෙළෙඳාම.

# දිළින්දන්ට හිතකර වෘද්ධිය (Pro-poor Growth)

- දිළිඳු අයගේ මධ්‍යන ආදායම දිළිඳු නොවන අයගේ මධ්‍යන ආදායමට වඩා වැඩි වේගයකින් ඉහළ යාම. මෙහිදී ආදායමේ විෂමතාව අඩුවේ

- වෘද්ධිය නිසා දිළින්දන්ගේ ප්‍රතිලාභ වැඩිවේ නම් එය දිළින්දන්ට හිතකර වෘද්ධියයි මෙහිදී ආදායම බේදී යාමට කවරක් වුවද කම් නැත.

## දිළින්දන්ට හිතකර වෘද්ධියට යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්ති

- සාර්ව ආර්ථික ප්‍රතිපත්ති
  - උද්ධමනය පාලනය කිරීම
  - තෝරාගනු ලබන පදනමක් මත විවෘත වෙළෙදාමට ඉඩ දීම

- ආංශික ප්‍රතිපත්ති
- - දිළින්දන් වඩා ක්‍රියාශීලි ආර්ථික ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම

(උදා කෘෂිකර්මය, මානව ප්‍රාග්ධනය සංවර්ධනය, කාන්තාවන් සවිබල ගැන්වීම්

- ප්‍රාදේශීය ප්‍රතිපත්තිය
  - ග්‍රා මීය ප්‍රදේශ සංවර්ධනය කිරීම

- ආදායම් පුණර්ව්‍යාප්ති ප්‍රතිපත්ති
  - ඉඩම් බෙදාදීම
  - ණය පහසුකම් සැකසීම
  - සංක්‍රාම ආදායම් ලබාදීම

# සාර්ව සහභාගීත්ව ආර්ථික වෘද්ධිය
# (Inclusive Economic Growth)

- ආර්ථිකයේ සියලු අංශයන්ට ව්‍යාප්ත වූ ඉහළ තිරසාර වර්ධනයක් ළගා කර ගැනීම සාර්ව සහභාගීත්ව ආර්ථික වෘද්ධිය වේ.

- ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙන් ඈත්ව සිටින සමාජ කොටස්වලට ද එම ක්‍රියාවලියට සහභාගී වීම මගින් සමාජයේ සෑම පුරවැසියෙකුටම ආර්ථික වර්ධනයකට දායක වීමටත්, එමගින් ප්‍රතිලාභ හිමි කර ගැනීමටත් අවස්ථාව උදා වේ.

- ආදායම් ප්‍රතිපත්තියත් සමඟ සමාජයේ පුද්ගලයන්ට ආර්ථික කටයුතුවලට දායක වීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීම සහ සේවා නියුක්ති අවස්ථා ජනනය කිරීම සඳහා යෝග්‍ය ව්‍යාපාරික පරිසරයක් ගොඩනැංවීම එමගින් අවධාරණය කෙරේ

# මහ බැංකු වාර්ෂික වාර්තාවල "විශේෂ සටහන්" වල කාලීන වශයෙන් වැදගත් වන ජාතික හා ජාත්‍යන්තර තොරතුරු හා දත්ත



**විශේෂ සටහන 6** **සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක් සඳහා යටිතල පහසුකම්**

**හැඳින්වීම**

ආර්ථිකයේ සෑම අංශයකම පැතිරුණු ඉහළ තිරසාර වර්ධනයක් ළඟාකර ගැනීම සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් (Inclusive Growth) යන්නෙන් අදහස් වේ. සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථිකයක වෙළෙඳපොළ ප්‍රවිශ්‍යය, සම්පත් සහ සමාජ ආරක්ෂණය සඳහා පවතින ඉඩ ප්‍රස්ථා ඉහල මට්ටමක පැවතිය යුතුය. සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක දී ආර්ථික වර්ධන රටාව මෙන්ම ආර්ථික වර්ධන වේගය ද වැදගත් වන අතර, එමගින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙන් ඈත්ව සිටින සමාජ කොටස්වලට ද ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට එකතුවීමට ඉඩ සැලසීම ඉතා වැදගත් වේ. ඒ අනුව සමාජයේ සෑම පුරවැසියෙකුටම ආර්ථික වර්ධනයට ඵලදායී ලෙස අඩු කරමින්, සමාජ ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමට හැකිවෙන පරිදි ආර්ථික වර්ධනය පුළුල් පදනමක් සහිත, වේගවත් සහ සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණු වලින් සමන්විත වේ. එමනිසා, රජයේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ප්‍රාදේශීය වශයෙන් සමබර ආර්ථික වර්ධනයක් අත්පත් කරගැනීම පිළිබඳව අවධානය යොමුවී ඇත. එසේම, සර්ව සහභාගිත්වයක් සහිත තුලිත ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා ආර්ථික, සමාජ සහ මූල්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ ජීවන මට්ටම උසස් කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රමුඛතාවය හඳුනාගැනීම වැදගත් වේ.

- වෘද්ධි ක්‍රියාවලිය ජය ගත් රටවල පොදු ලක්ෂණ පහත දැක්වේ.
- ගෝලීය ආර්ථිකයෙහි පූර්ණ ලෙස වාසි ලබා ගැනීම
- සාර්ව ආර්ථිකයෙහි ස්ථායිතාව පවත්වා ගැනීම
- ඉහළ ඉතුරුම් හා ආයෝජන මට්ටමක් රඳවා ගැනීම
- සම්පත් බෙදා හැරීම වෙළෙඳපොළ බලවේග මගින් සිදු වීම
- කැප වුණු විශ්වසනීය හා කාර්යක්ෂම ආණ්ඩු පැවතීම

## ආර්ථික සංවර්ධනය (Economic Development)

ආර්ථික සංවර්ධනය (Economic Development) යන සංකල්පය, ආර්ථික වර්ධනය (Economic Growth) හෝ සංවර්ධනය (Development) හෝ යන සංකල්ප වලින් වෙනස් වේ. බොහෝ අය එය සංවර්ධනය යන සංකල්පය ලෙස අර්ථ දැක්වීමට උත්සහ දරති. එය නිවැරදි නොවේ.

**ආර්ථික සංවර්ධනය යනු ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන ස්වරූප දෙකෙහිම වෙනස්කම් ඇතුලත් පරිණාමන ක්‍රියාවලියකි.** ආර්ථික වර්ධනය මගින් එහි ප්‍රමාණාත්මක පැතිකඩ නිරූපණය කෙරේ. එම නිසා ආර්ථික සංවර්ධනය මගින් ප්‍රමාණාත්මක පැතිකඩට (ආර්ථික වෘද්ධියට) වඩා වැඩි යමක් අදහස් කෙරේ. එනම් ගුණාත්මක පැතිකඩයි. මෙම ගුණාත්මක පරිවර්තනයන් ආර්ථිකයේ ව්‍යුහමය වෙනස්වීම් මගින් හ÷නා ගත හැකිය. **යම් රටක ආර්ථික වර්ධනයත් සමඟ පහත සඳහන් ගුණාත්මක ස්වරූපයේ ව්‍යුහමය වෙනස්කම් ඇතිවීම ආර්ථික සංවර්ධනය** ලෙස වටහා ගත හැකිය.

(i) **කෘෂිකාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය පහළ යාම** රටක මු¨ නිෂ්පාදිතයට හා සේවා නියුක්තියට කෘෂි අංශයේ දායකත්වය මෙන්ම ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණයත් ක්‍රමිකව පහල වැටේ.

(ii) **කාර්මික අංශයේ සාපේක්ෂ වැදගත්කම වැඩි වී** කාර්මීකරණය වේගවත් වීම.

(iii) **නිෂ්පාදන සම්පත්වල ඵලදායිතාව ඉහළ යාම.** ශ්‍රම හමුදාවේ අධ්‍යයන මට්ටම හා සුදුසුකම් ඉහළ නැංවීම මගින් මානව ප්‍රාග්ධනය ගොඩනැංවීම හා ශ්‍රමය සමඟ යොදා ගැනෙන භෞතික ප්‍රාග්ධන තොගය ඉහළ නැංවීම යන පියවරයන් හි ප්‍රතිඵලය වනුයේ රටක ඵලදායිතාව ඉහළ යාමයි.

(iv) **නිෂ්පාදන ක්‍රම ශිල්ප සහ තාක්ෂණය උසස්වීම** නව නිෂ්පාදන ක්‍රම සහ නව භාණ්ඩ පරාසයන් බිහි කරමින් නිෂ්පාදන ක්‍රියාවලියෙන් සහ නිෂ්පාදන තාක්ෂණයෙහි අඛණ්ඩව සිදුවන ක්‍රියාදාමය මේ නම් වේ.

**(v) වෙළෙඳ රටාවේ වෙනස්වීම් හට ගැනීම**

ප්‍රාථමික නිෂ්පාදිත (කෘෂි, ධීවර යනාදි) අතලොස්සක් මත පදනම් වූ අපනයන වෙළෙඳාම වෙනුවට, විවිධාංගීකරණ වූ අපනයන භාණ්ඩ රාශියක් පදනම් කර ගත් අපනයන ව්‍යුහයක් බිහි වීම මෙ මගින් අදහස් වේ

**(vi) නවීකරණය වීම**

**(vii) ආයතනිකමය වෙනස්කම් සිදු වීම**

- රජය පෞද්ගලික අංශය හසුරුවන්නකු නොව පෞද්ගලික අංශයට පහසුකම් සහ සානුබල සපයන්නෙකුගේ කාර්යභාරය දක්වා වෙනස්වීම
- යටිතල පහසුකම්වල වර්ධනය (මහා මාර්ග, වරාය, සංනිවේදන)
- කාර්යක්ෂම මූල්‍ය ආයතන පද්ධතියක පැන නැගීම
- නෛතික පද්ධතිය ස්ථාපිත කිරීම
- නීතියේ ආධිපත්‍යය තහවුරු කිරිම
- දේපොල අයිතිය සුරක්ෂිත කිරීම සහ කාර්යක්ෂම නියාමන ක්‍රමයන් ගොඩ නැංවීම [36]

ආර්ථික සංවර්ධනය = ආර්ථික වර්ධනය (ප්‍රමාණාත්මක වෙනස්කම්) + ගුණාත්මක වෙනස්කම්

↓

# *What is Development?*

**සංවර්ධනය යනු මිනිස් ජීවිතයන්හි ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවෙන ක්‍රියාවලියකි. එනම් ජීවිතයන්හි ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම යටතේ ආර්ථික, සමාජ, දේශපාලනික, සංස්කෘතික හා ආයතනික ක්‍රියාවලියක සංයෝජනය තුළින් මිනිසුන්ගේ ජීවන තත්ත්වය (පෝෂණය, සෞඛ්‍යය, පිරිසිදු පරිසරය) උසස් කිරීමත්, ආත්ම ආභිමානය වර්ධනය කර ගැනීමටත් අවශ්‍ය පරිසරය සකස්වීම සංවර්ධනය නම් වේ.**

සංවර්ධනය යනු පැහැදිලිවම ආර්ථික සංසිද්ධියක් නොව සමාජ ව්‍යුහය, ආකල්ප හා ආයතන ක්ෂේත්‍රයේ මූලික වෙනස්කම් සිදුකරමින් ආර්ථික වෘද්ධිය, අසමානතාවය අඩුකිරීම හා දරිද්‍රතාව දුරුලීම යනාදිය බිහි කරමින් හටගන්නා ක්‍රියාවලියක් බව පැහැදිලි වේ. ඒ අනුව මිනිස් ජීවිතයන්හි ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීමට එය මග පෙන්වයි. එම නිසා **සංවර්ධනය යනු මිනිස් ජීවිතයන්හි ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවෙන ක්‍රියාවලියකි.**

එනම් ජීවිතයන්හි ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම යටතේ ආර්ථික, සමාජ, දේශපාලනික, සංස්කෘතික හා ආයතනික ක්‍රියාවලියක සංයෝජනය තුළින් මිනිසුන්ගේ ජීවන තත්ත්වය (පෝෂණය, සෞඛ්‍යය, පිරිසිදු පරිසරය) උසස් කිරීමත්, ආත්ම ආභිමානය වර්ධනය කර ගැනීමටත් අවශ්‍ය පරිසරය සකස්වීම සංවර්ධනය නම් වේ. තවද, ආර්ථික වෘද්ධිය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වුව ද ප්‍රමාණාත්මක සාධකයක් නොවේ.

**ඩඩ්ලි සියර්ස් (Dudly Seers) 1969, "සංවර්ධනයේ අර්ථය"**

**(The Meaning of Development) නම් පර්යේෂණ ලිපිය මගින් ඉදිරිපත් කල අදහස**

මෙම අදහස යටතේ ප්‍රශ්න තුනකට ලබා දෙන පිළිතුරු තුළින් සංවර්ධනය සඳහා **කොන්දේසි තුනක් සපුරාලිය යුතු** බව සියර්ස් පෙන්වා දුන්නේය.

**ආර්ථික වර්ධනය සමග දරිද්‍රතාවට කුමක් සිදුවී ද? විරැකියාවට කුමක් සිදුවී ද? ආදායම් විෂමතාවයට කුමක් සිදුවී ද?**

මෙම ප්‍රශ්න තුනම ඉහළ අගයන්හි සිට පහළ අගයන් කරා ළඟා වී තිබේ නම්, එම රට සංවර්ධන කාලපරිච්ඡේදයක ගත කොට ඇති බව කිව හැකියි

එනම් **ආර්ථික වෘද්ධියත් සමඟ දරිද්‍රතාව පහළ වැටීම, ආදායම් විෂමතාව අඩුවීම සහ විරැකියාව පහළ වැටීම (සේවා නියුක්තිය ඉහළ යාම)** සංවර්ධනය සඳහා සපුරාලිය යුතු කොන්දේසි තුන වේ.

# අමාර්ත්‍ය කුමාර් සෙන්

මිනිසාගේ නිදහස පුළුල් කෙරෙන ඒකාබද්ධ ක්‍රියාවලිය සංවර්ධනය බව පෙන්වා දි ඇත. (Development as an integrated process of expansion of substantive freedoms) ආර්ථික වෘද්ධිය ඉහළ නැංවීම සංවර්ධනයේ අවසාන අරමුණ නොවන අතර, මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීම හා ස්වාධිනතාවන් (නිදහස) භුක්ති විදිමට සැලැස්වීම සංවර්ධනයෙන් අපේක්ෂා කරන බව සෙන් පෙන්වා ඇත.

සංවර්ධනය අර්ථ දැක්වීම හා එය මිනුම් කිරීම සම්බන්ධයෙන් සෙන්ගේ හැකියාව පිළිබඳ ප්‍රවේශය (Sen's Capabilities approach) සංවර්ධන ආර්ථික විද්‍යාඥයින් සහ සමාජ විද්‍යාඥයින් අතර අතිශයින් ජනප්‍රිය වී ඇත. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ මානව සංවර්ධනය යන සංකල්පය පැන නැගීමටත් එය මිනුම් කිරීම සඳහා මානව සංවර්ධන දර්ශකය ගොඩ නැගීමටත් සෙන්ගේ විග්‍රහය මනා පිටුබලයක් සපයනු ලැබීය.

*මහාචාර්ය ඩෙනිස් ගුලේ (Denis Goulet) ට අනුව සංවර්ධනය අර්ථ දැක්වීමේ දි එහි හර වටිනාකම් (Core Values) තුනක් අවධාරණය කොට ඇත.*

1. ***දිවි පැවැත්ම - මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාව***

*Life Substenance - (The ability to meet basic needs)*

2. ***ආත්ම අභිමානය - ස්වාධීන පුද්ගලයකු වශයෙන් කටයුතු කළ හැකි වීම***

*Self-Esteem - (To be a person)*

3. ***පුද්ගල නිදහස - තෝරා ගැනීමට ඇති හැකියාව***

*Freedom from Servitude - To be able to choose*

*ඩෙනිස් ගුලේ දක්වා ඇත්තේ යම් රටක ජනතාව* ***දුප්පත්කම, නූගත්කම සහ දීනබව*** *යන අයහපත් තත්ත්වයන් තුනින් නිදහස ලබා ගැනීම සංවර්ධනය ලෙස අර්ථ දැක්විය හැකි බවයි.*

## මානව සංවර්ධනය (Human Development)

*මෙම නව ප්‍රවේශයට අනුව සංවර්ධන ප්‍රයත්නයක පරමාර්ථය විය යුත්තේ මානව වර්ගයාට පූර්ණ ජීවිතයකට අවස්ථා සලසා දීම බව අවධාරණය කෙරුණි. සංවර්ධනය ජනතාව මත පදනම්ව (People Centered Development Approach) අර්ථ දැක්වීම වඩාත් යෝග්‍ය බවට අදහස් ඉදිරිපත් වුණි.*

*1990 දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nation's Development Program - UNDP) විසින් මානව සංවර්ධන ප්‍රවේශය (Human Development Approach) ඉදිරිපත් කිරීමත් සමඟ පැහැදිලි හා නිශ්චිත වශයෙන් ජනතාව මත පදනම්ව සංවර්ධන සංකල්පය අර්ථ දැක්වීමට අවශ්‍ය පදනම වැටුණි. ඒ අනුව 1990 දී නිකුත් කරන ලද මානව සංවර්ධන වර්තාව (Human Development Report) මගින් මානව සංවර්ධන සංකල්පය ඉදිරිපත් කරනු ලැබිණි. මානව සංවර්ධන ප්‍රවේශය හඳුන්වා දීමේ දී පුරෝගාමී කාර්යයභාරයන් පකිස්තානු ආර්ථික විද්‍යාඥයකු වූ මාබුබ් අල් හක් (Mahbub Ul Haq) විසින් සිදු කරන ලදී.*

## *Human Development*



*Mahbub ul Haq (1934-1998)*
*Founder of the Human Development Report*

"**The basic purpose of development is to enlarge people's choices**. In principle, these choices can be infinite and can change over time. People often value achievements that do not show up at all, or not immediately, in income or growth figures: greater access to knowledge, better nutrition and health services, more secure livelihoods, security against crime and physical violence, satisfying leisure hours, political and cultural freedoms and sense of participation in community activities**. The objective of development is to create an enabling environment for people to enjoy long, healthy and creative lives."**

මානව සංවර්ධන ප්‍රවේශය මගින් සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රීය යොමුව ද **ජාතික ගිණුම් සැකසීමේ සිට පුද්ගල කේන්ද්‍රීය (ජනතා කේන්ද්‍රීය)** ප්‍රතිපත්ති දක්වා ගමන් කිරීම ආරම්භ විය. සංවර්ධනය අර්ථ විග්‍රහ කිරීමේ දි  මානව සංවර්ධන ප්‍රවේශය මගින් ප්‍රධාන වශයෙන් රටක සැබෑ ධනය ලෙස රටක වෙසෙන ජනතාව (People are the real wealth of a nation) අභිමුඛ කොට අදහස් ඉදිරිපත් කර ඇත.

ජාතියක සැබෑ ධනය වන ජනතාවට දිගු සෞඛ්‍ය සම්පන්න හා නිර්මාණශීලී ජීවිතයක් ගත කිරීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම සංවර්ධනයේ මූලික පරමාර්ථ විය යුතුය. එක්සත් ජාතීන්ගේ සංවර්ධනය වැඩපිළිවෙල මානව සංවර්ධන සංකල්පය පහත ආකාරයට නිර්වචනය කර ඇත.

# මානව සංවර්ධනය
# Human Development

**මානව හැකියාවන් සහ කාර්යයන් ප්‍රසාරණය වන පරිදි රටක ජනතාවගේ තෝරා ගැනීමේ පරාසය පුළුල් වීමේ ක්‍රියාවලිය මානව සංවර්ධනයයි**

**Human development is the process of enlarging people's choices by expanding human functionings and capabilities**


යහපත් ජීවන තත්ත්වයක් සඳහා ජනතාව තුළ පවත්නා වූ අපේක්ෂාවන්හි විශ්වාසනීයත්වය තහවුරුවීම මානව සංවර්ධනය මගින් අපේක්ෂා කරයි.

මානව සංවර්ධනය **ප්‍රධාන මාන තුනක්** යටතේ සලකා බැලේ
.


1. **දීර්ඝ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම. (දීර්ඝායුෂ)**
   (Long and Healthy life)

2. **දැනුම** (Knowledge)

3. **යහපත් ජීවන තත්ත්වය** (Decent Standard of living)




*2015 මානව සංවර්ධන වාර්තාව මඟින් තවත් පැතිකඩ හතරක් මානව සංවර්ධන ප්‍රවේශය යටතේ අන්තර්ගත කිරීම පිළිබඳව අවධාරණය කර ඇත.*




# මානව සංවර්ධන දර්ශකය :2010 Report
# Human Development index (HDI)

- දිර්ඝායුෂ : උපතේදි ජීවන අපේක්ෂාව

- දැනුම
  - → පාසල් අධ්‍යාපනය ලැබූ වසර සංඛ්‍යාවේ මධ්‍යයන අගය
  - → පාසල් අධ්‍යාපනය ලැබීමට ප්‍රවේශවන දරුවකු අධ්‍යාපනයේ නිරත වෙතියි අපේක්ෂිත වසර සංඛ්‍යාව

- යහපත් ජීවන තත්ත්වය : ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමරිකානු ඩොලර්)


A decent standard of living
GNI per capita (PPP $)
GNI index
Human Development Index (HDI)
Life expectancy index
Life expectancy at birth
Long and healthy life
Knowledge
Mean years of schooling
Education index
Expected years of schooling

රටක, සමාජ - ආර්ථික සාධනයේ පුළුල් පැතිකඩක් (dimensions) ආවරණය වන "මානව සංවර්ධන දර්ශකය" තනි සංයුක්ත දර්ශකයක් ලෙස සැකසෙනුයේ මූලික පැතිකඩ කිහිපයක් ඒකාබද්ධ කරමිනි. එම මූලික පැතිකඩ කවරේ ද?

(1) දීර්ඝායුෂ, දැනුම සහ පෝෂණය යි.
(2) පාසල් අධ්‍යාපනය ලැබූ වසර ගණන, වැඩිහිටි සාක්ෂරතාව සහ පිරිසිදු පරිසරය යි.
(3) දීර්ඝායුෂ, දැනුම සහ යහපත් ජීවන තත්ත්වය යි.
(4) පෝෂණය. දැනුම සහ වැඩිහිටි සාක්ෂරතාවය යි.
(5) දීර්ඝායුෂ, ළදරු මාර්තෘතාව සහ යහපත් ජීවන තත්ත්වය යි.

| පැතිකඩ (Dimensions) | දර්ශක (Indicators) | |
|---|---|---|
| | 2000-2009 දක්වා | 2010 පසු |
| 1. දීර්ඝායුෂ (සෞඛ්‍යය) Longevity | උපතේ දී ආයු අපේක්ෂාව (Life expectancy at birth) | උපතේ දී ආයු අපේක්ෂාව (Life expectancy at birth) |
| 2. දැනුම (Knowledge) | * වැඩිහිටි සත්ෂරතා අනුපාතය (Adult literacy Rate)<br>* ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය ලබන ප්‍රතිශතය (Gross Enrolment Ratio) | * පාසල් අධ්‍යාපනය ලැබූ වසර සංඛ්‍යාවේ මධ්‍යයන අගය (Mean years of schooling)<br>* පාසල් අධ්‍යාපනය ලැබීමට ප්‍රවේශ වන දරුවකු අධ්‍යාපනයේ නිතර වෙතැයි අපේක්ෂිත වසර සංඛ්‍යාව (Expected Years of schooling) |
| 3. යහපත් ජීවන තත්ත්වය (Decent Standard of Living) | * ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රතිශීර්ෂ දළ දේශීය ආදායම (ඇමෙරිකානු ඩොලර්) (Gross Domestic Income per capita - ppp$) | * ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) - (Gross National Incom per capita - PPP $) |

මූලාශ්‍රය : මානව සංවර්ධන වාර්තා (විවිධ වර්ෂ)

## මානව සංවර්ධනය මිණුම් කිරීම

*(i) මානව සංවර්ධන දර්ශකය (Human Developments Index - HDI)*

*(ii) විෂමතාවන්ට ගලපන ලද මානව සංවර්ධන දර්ශකය (Inequality - Adjusted Human Development Index -IHDI)*

*(iii) ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතා දර්ශකය (Gender – Inequality Index - GII)*


***A composite measure*** *reflecting inequality in achievements between women and men in* ***three dimensions****: reproductive health,empowerment and the labour market.*

*(iv) බහුමාන දරිද්‍රතා දර්ශකය (Multidimensional Poverty Index - MPI)*

*(v) ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ සංවර්ධන දර්ශකය (Gender Development Index - GDI)*

## FIGURE 1

**Evolution of human development composite indices**




Source: Human Development Report Office.

***Measuring human development***

*The Human Development Index (HDI) is a composite index focusing on three basic dimensions of human development: the ability to lead a long and healthy life, measured by life expectancy at birth; the ability to acquire knowledge, measured by mean years of schooling and expected years of schooling; and the ability to achieve a decent standard of living, measured by gross national income per capita.*

*To measure human development more comprehensively, the Human Development Report presents four other composite indices.* ***The Inequality-adjusted HDI*** *discounts the HDI according to the extent of inequality.* ***The Gender Development Index*** *compares female and male HDI values.* ***The Gender Inequality Index*** *highlights women's empowerment. And the* ***Multidimensional Poverty Index*** *measures non-income dimensions of poverty.*

*Source: Human Development Report Office.*

## *මානව සංවර්ධන දර්ශකය :*

## ***Human Development index (HDI)***

මානව සංවර්ධනය මිනුම් කිරීම සඳහා ප්‍රකාශයට පත්කරන ලද සංයුක්ත දර්ශකයකි. මානව සංවර්ධනයේ ප්‍රධාන පැතිකඩ තුනක් වන සෞඛ්‍යය ( දිර්ඝායුෂ), අධ්‍යාපනය (දැනුම) සහ ජීවන තත්ත්වය යන ක්ෂේත්‍ර සම්බන්ධව කිසියම් රටක් ලබා ඇති සාධන මට්ටම මිනුම් කරනු ලබන්නේ මානව සංවර්ධන දර්ශකය මගිනි. (The HDI is a summary measure for assessing progress in three basic diamensions of human development: a long healthy of life, acces to knowledge and a decent standard of living). ඉහත ප්‍රධාන පැතිකඩ තුන ආවරණය කෙරෙන උප දර්ශක හතරක් පවතින අතර ඒ ඒ පැතිකඩට අදාළ උප දර්ශක පහත පරිදි සාරාංශ කළ හැකි ය.

- *දිර්ඝායු : උපතේදී ජීවන අපේක්ෂාව* - ***SDG 3***
- *දැනුම*
  - → *පාසල් අධ්‍යාපනය ලැබූ වසර සංඛ්‍යාවේ මධ්‍යයන අගය-* ***SDG 4.6***
  - → *පාසල් අධ්‍යාපනය ලැබීමට ප්‍රවේශවන දරුවකු අධ්‍යාපනයේ නිරත වෙතියි අපේක්ෂිත වසර සංඛ්‍යාව-* ***SDG 4.3***
- *යහපත් ජීවන තත්ත්වය : ක්‍රය ශක්ති සාම්‍ය ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමරිකානු ඩොලර්)* - ***SDG 8.5***


03. සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයන්ගේ සෞඛ්‍ය තත්ත්වය උසස් කොට නීරෝගී ජීවිතයක් තහවුරු කිරීම.

04. ගුණාත්මක අධ්‍යාපනයක් සමාන ලෙස සිය ¨ දෙනාටම ලබා §මට සහ සිය¨ දෙනාටම ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථාව ලබා §ම.

**4.3 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනයද ඇතුළු තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම.**

**4.6. 2030 වන විට සියලුම තරුණ තරුණියන් සහ කාන්තා, පිරිම, වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබාසිටීම.**

*08.* සර්ව සහභාගීත්ව ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීම, සියළු දෙනාටම පූර්ණ හා ඵලදායි රැකියා අවස්ථා ලබා දිම.




***8.5. 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුදුසු රැකියා අවස්ථාවන් ලබාදීම.***

# රටවල් වර්ගීකරණය ( 2014 HDR)

Human Development Report **2014**

**Sustaining Human Progress:**
Reducing Vulnerabilities and Building Resilience

| | |
|---|---|
| (i) පහළ මානව සංවර්ධනය සහිත රටවල් **Low human development** | **0.550 ට වඩා අඩු** |
| (ii) මධ්‍යම මානව සංවර්ධනය සහිත රටවල් **Medium human development** | **0.550-0.699** |
| (iii) ඉහළ මානව සංවර්ධනය සහිත රටවල් **High human development** | **0.700-0.799** |
| (iv) ඉතා ඉහළ මානව සංවර්ධනය සහිත රටවල් **Very high human development** | **0.800 හෝ වැඩි** |

HDI classifications are based on HDI fixed cut-off points, which are derived from the quartiles of distributions of component indicators. The cut-off points are HDI of less than 0.550 for low human development, 0.550–0.699 for medium human development, 0.700–0.799 for high human development and 0.800 or greater for very high human development.

Human Development Report 2020

## The Next Frontier: Human Development and the Anthropocene

***Briefing note for countries on the 2020 Human Development Report***

**Table A: Sri Lanka's HDI trends based on consistent time series data and new goalposts**

| | Life expectancy at birth | Expected years of schooling | Mean years of schooling | GNI per capita (2017 PPP$) | HDI value |
|---|---|---|---|---|---|
| 1990 | 69.5 | 11.3 | 8.4 | 3,857 | 0.629 |
| 1995 | 69.3 | 11.9 | 9.1 | 4,740 | 0.654 |
| 2000 | 71.3 | 12.5 | 10.0 | 5,850 | 0.691 |
| 2005 | 74.7 | 13.1 | 10.4 | 6,872 | 0.725 |
| 2010 | 75.4 | 13.6 | 10.8 | 9,041 | 0.754 |
| 2015 | 76.3 | 13.9 | 10.9 | 11,600 | 0.776 |
| 2016 | 76.5 | 13.9 | 10.5 | 11,961 | 0.773 |
| 2017 | 76.6 | 13.8 | 10.6 | 12,251 | 0.775 |
| 2018 | 76.8 | 13.9 | 10.6 | 12,516 | 0.779 |
| 2019 | 77.0 | 14.1 | 10.6 | 12,707 | 0.782 |

Sri Lanka's HDI value for 2019 is 0.782— which put the country in the high human development category—positioning it at 72 out of 189 countries and territories.

Between 1990 and 2019, Sri Lanka's HDI value increased from 0.629 to 0.782, an increase of 24.3 percent. Table A reviews Sri Lanka's progress in each of the HDI indicators. Between 1990 and 2019, Sri Lanka's life expectancy at birth increased by 7.5 years, mean years of schooling increased by 2.3 years and expected years of schooling increased by 2.8 years. Sri Lanka's GNI per capita increased by about 229.4 percent between 1990 and 2019.

# දකුණු ආසියානු කලාපයේ මානව සංවර්ධන දර්ශකයේ අගය

| රට | මානව සංවර්ධන දර්ශකය- | | ස්ථානය |
|---|---|---|---|
| | **2018** | **2019** | (Rank) 2019 |
| ශ්‍රී ලංකාව | 0.779 | 0.782 | 72 |
| මාලදිවයින | 0.734 | 0.740 | 95 |
| භූතානය | 0.649 | 0.654 | 129 |
| ඉන්දියාව | 0.642 | 0.645 | 131 |
| බංග්ලාදේශය | 0.625 | 0.632 | 133 |
| නේපාලය | 0.596 | 0.602 | 142 |
| මියන්මාරය | 0.579 | 0.583 | 147 |
| පකිස්ථානය | 0.552 | 0.557 | 154 |
| ඇෆ්ගනිස්ථානය | 0.509 | 0.511 | 169 |
| දකුණු ආසියාව | 0.637 | 0.641 | |



Source: HUMAN DEVELOPMENT REPORT - 2020

## 2020 HDR අනුව ගෝලීය වශයෙන් ඉහළම මානව සංවර්ධන දර්ශකයට හිමිකම් කියන රටවල් පහ

| Rank Country | Value |
|---|---|
| **1** Norway | 0.957 |
| **2** Ireland | 0.955 |
| **2** Switzerland | 0.955 |
| **4** Hong Kong, China (SAR) | 0.949 |
| **4** Iceland | 0.949 |

Source: HUMAN DEVELOPMENT REPORT - 2020

## *2020 HDR* අනුව ලෝකයේ පහළ ම මානව සංවර්ධන මට්ටමට හිමිකම් කියන රටවල් පහ

| Rank Country | Value |
|---|---|
| **185** Burundi | 0.433 |
| **185** South Sudan | 0.433 |
| **187** Chad | 0.398 |
| **188** Central African Republic | 0.397 |
| **189 Niger** | 0.394 |

Source: HUMAN DEVELOPMENT REPORT - 2020

| මානව සංවර්ධනයේ පැතිකඩ | සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ |
|---|---|
| 1. දීර්ඝ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම (Living a long and healthy Life) | <u>අභිමතාර්ථ (1), (4), (5), (6)</u><br>(1) අන්ත දුගීභාවය හා කුසගින්න පිටු දැකීම<br>(4) ළමා මරණ අඩු කිරීම.<br>(5) මාතෘ සෞඛ්‍යය නංවාලීම.<br>(6) HIV/ AIDS, මැලේරියාව හා සෙසු රෝග මර්ධනය. |
| 2. දැනුම ලබා ගැනීම (Being Knowledgeable) | <u>අභිමතාර්ථ (2), (3)</u><br>(2) සැමට ප්‍රාථමික අධ්‍යාපනය.<br>(3) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සහ කාන්තාවන් සවිබල ගැන්වීම. |
| 3. යහපත් ජීවන තත්ත්වයක් සඳහා අවශ්‍ය සම්පත්වලට ප්‍රවේශයක් තිබීම. (Having a decent standard of living) | <u>අභිමතාර්ථ (1), (7), (8)</u><br>(1) අන්ත දුගීභාවය පිටු දැකීම හා කුසගින්න පිටු දැකීම.<br>(7) පරිසරයේ තිරසාර පැවැත්ම සහතික කිරීම.<br>(8) සංවර්ධනය සඳහා ජගත් හවුල්කාරිත්වයක් ගොඩ නැගීම. |

**මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා (වාසි, යහපත් මග පෙන්වීම්)**

1 රටක ජනතාවගේ ජීවන තත්ත්වය කෙරෙහි බලපානු ලබන ප්‍රමාණාත්මක හා ගුණාත්මක අංග ඇතුළත් වීම

2 සංවර්ධනයේ යෙදවුම් පාර්ශ්වය (Input) මෙන්ම නිමැවුම් (output) පාර්ශ්වය ද මෙමගින් නියෝජනය වීම යහපත් තත්ත්වයකි

3 ඒ ඒ රටවල **සංවර්ධන මට්ටම පිළිබඳව** අවබෝධයක් ලබා ගත හැකි වීම

4 සංවර්ධනය යන්නට ඇතුළත් දෑ කවරේ ද? සංවර්ධන ක්‍රියාවලියක දී එහි ස්වරූපය කෙබඳු ද? එහි දී සාර්ථක වී ඇති රටවල් මොනවා ද යන්න පිළිබඳව දැනුම හා අවබෝධය පුළුල් වීමට දායක වන ප්‍රයෝජනවත් මිනුමක් වීම

5 මානව සංවර්ධනය යනු මිනිසාගේ තේරීම් සිදු කිරීමට නිදහස පුළුල් කරන ක්‍රියාවලියක් නිසා තේරීම් වලට අදාල වන අංගයන් ඇතුළත් කරමින් දර්ශකය පුළුල් කිරීමට අවකාශ පැවැතීම

6 සංවර්ධනය හා ජනතාව (People and Development) ඒකාබද්ධ කිරීම හරහා අර්ථවත්ව සංවර්ධනය මිනුම් කිරීම සඳහා අර්ථවත් සමාහාර මිනුමක් මෙමගින් සැපයීම

# සංවර්ධන මිණුමක් වශයෙන් මානව සංවර්ධන  දර්ශකයේ දුර්වලතා

(1) මානව සංවර්ධන දර්ශකයේ ප්‍රධාන පැතිකඩවලට **සමාන බර තැබීමක්** කිරීම අඩුපාඩුවකි.

(2) මානව සංවර්ධන දර්ශකය ඒකාබද්ධ මිණුමකි. එමඟින් රටක සූක්ෂම වශයෙන් හඳුනාගත හැකි **විෂමතා හඳුනාගත නොහැකි** උදා:- ග්‍රාමීය නාගරික වශයෙන් පවතින ප්‍රාදේශීය විෂමතා ස්ත්‍රී පුරුෂ බව අනුව පවතින විෂමතා, ආදායම් ව්‍යාප්ති විෂමතා සහ කුල ගෝත්‍ර වශයෙන් පවතින විෂමතා.

(3) මානව සංවර්ධනයේ **සියළු අංශ සැලකිල්ලට නොගැනීම** අඩු පාඩුවකි. (දේශපාලන නිදහස, මානව සුරක්ෂිත බව, සමානාත්මකව හා සමාජ යුක්තිය)

(4) අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය, සෞඛ්‍ය පහසුකම්වල ගුණාත්මක තත්ත්වය යනාදී වශයෙන් **ගුණාත්මක වෙනස්කම් සැළකිල්ලට නොගැනීම**.

(5) **පාරිසරික බලපෑම** මානව සංවර්ධන දර්ශකය තුළ ඇතුළත්ව නොතිබීම අඩුපාඩුවකි.

## Multidimensional Poverty Index: New Approach to Global Poverty

The Oxford Poverty and Human Development Initiative (OPHI) has developed a new international measure of poverty – the Multidimensional Poverty Index or MPI – for the 20th Anniversary edition of the United Nations Development Programme's flagship Human Development Report. **The new innovative index goes beyond a traditional focus on income to reflect the multiple deprivations that a poor person faces with respect to education, health and living standard.**

The global Multidimensional Poverty Index (MPI) identifies multiple deprivations at the household level in health, education and standard of living.

# බහුමාන දරිද්‍රතා දර්ශකය
# Multidimensional Poverty Index (MPI)

බහුමාන දරිද්‍රතා දර්ශකය = ජනගහන දරිද්‍රතා දර්ශකය × විහීනතා දර්ශකය

***MPI = HCI × Intensity of Poverty***


සෞඛ්‍ය
- පෝෂණය
- ළමා මර්ත්‍යතාවය

අධ්‍යාපනය
- පාසල් ගිය වර්ෂ ගණන
- පාසලට ඇතුළ් වූ ළමයින් සංඛ්‍යාව

ජීවන තත්ත්වය

- ගෘහස්ත ඉන්ධන දර, ගල් අඟුරු, වියළි ගොම
- වැසිකිළි පහසුකම්
- ආරක්ෂිත පානීය ජලය
- විදුලි බල සැපයුම
- ගෙබිම
- වත්කම් ගුවන් විදුලිය, රූපවාහිනිය, බයිසිකලය, යතුරු පැදිය, දුරකථනය

# Dimensions and Indicators of MPI



සෑම පුද්ගලයකුට ම අදාළ උප දර්ශක 10 සඳහා ලකුණු දීමක් සිදු කෙරේ. ඒ අනුව උපරිම ලකුණු 100 කි. අනෙක් අතට මාන තුන සඳහා සමාන බර තැබීමක් සිදු කෙරෙන අතර එක මානයකට අදාලව ලකුණු 33.3 (100/3) ක් ලැබේ. අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා දර්ශක දෙක බැගින් තිබෙන නිසා එක් දර්ශකයක් සියයට 16.7 (100x1/3x1/2) ක ලකුණු ප්‍රමාණයක් ලබයි. ජීවන තත්ත්වය පිළිබඳ මානයේ දී දර්ශක 6 ක් පවතින බැවින් බර තැබීම සියයට 5.6 (100x1/3x1/6) කි.

මෙම දර්ශකයේ මානවලින් යටත් පිරිසෙයින් තුනෙන් එකක ප්‍රමාණයකින් දක්වන විහිනතා වළක්වා ගත නො හැකි පුද්ගලයකු බහුමාන වශයෙන් දුප්පත් තැනැත්තෙක් ලෙස

සැලකේ. බහුමාන දරිද්‍රතා දර්ශකය යටතේ දරිද්‍රතාව පිළිබඳ ව මිනුම් දෙකක් සැපයේ. ඒවා නම් ජනගහන දරිද්‍රතා දර්ශකය (Incidence or Head Count) සහ දරිද්‍රතා තීව්‍රතා දර්ශකය (Average Intensity of Deprivation) යි.

ඉහත දැක් වූ අහිමිවීම්/විහිනතා සියල්ල එක් කොට බර තැබීමෙන් පසු ව ලැබෙන බරිත එකතුවෙන් තුනෙන් එකක් (සියයට 33 කටවත්) ලක් වූ පිරිස මුළු ජනගහනයෙන් කො පමණ ප්‍රමාණයක් ද යන්න ජනගහන දරිද්‍රතා දර්ශකය යන මිනුමෙන් දැක් වේ. එනම්

$$\text{ජනගහන දරිද්‍රතා දර්ශකය} = \frac{\text{බහුමාන වශයෙන් දරිද්‍රතාවට පත් ජනගහනය}}{\text{මුළු ජනගහනය}}$$

$$\text{දරිද්‍රතා තීව්‍රතා දර්ශකය} = \frac{\text{දරිද්‍රතාවෙන් යුතු පිරිස ලබා ගත් විහිනතා ලකුණුවල එකතුව}}{\text{දරිද්‍රතාවෙන් යුතු පිරිස}}$$

මෙම අගයන් දෙක ගුණ කිරීමෙන් තනි MPI අගයක් ලබා ගැනේ. මෙම ක්‍රමවේදය සබිනා අල්කිරේ (Sabina Alkire) සහ ජේම්ස් ෆොස්ටර් (James Foster) යන විද්වත් දෙපළ විසින් ඉදිරිපත් කරන ලද්දකි.

To identify the multidimensional poor, the deprivation scores for each indicator are summed to obtain the household deprivation score, A cut-off of 33.3 percent which is equivalent to 1/3 of the weighted indicators is used to distinguish between the poor and non-poor.


- Multidimensional poor: Deprivation score, k >=33.3 percent
- Vulnerable to poor: 20<=Deprivation score, k<33.3 percent
- Severely multidimensional poor: Deprivation score, k>=50 percent

# Global Multidimensional Poverty Index 2020




**Copyright @ 2020**
**By the United Nations Development Programme and Oxford Poverty and Human Development Initiative**

*Distribution of the population and those who are multidimensional poor by urban, rural and estate areas in Sri Lanka*




Source: Household Income and Expenditure Survey, 2019

*Global Multidimensional Poverty Index 2020*

## Multidimensional Poverty Measures In Sri Lanka -2016

| | |
|---|---|
| Multidimensional poverty Headcount Index (H) | 2.9 % |
| Intensity of Poverty (A) | 38.3% |
| Multidimensional poverty Index (MPI) | 0.011 |
| Vulnerable to multidimensional poverty | 14.3% |
| Severely multidimensional poor | 0.3% |

*බහුමාන දරිද්‍රතා දර්ශකය* = *ජනගහන දරිද්‍රතා දර්ශකය* *X* *විහීනතා දර්ශකය*

**Multidimensional Poverty Index, MPI = H * A**
**= 2.9% x 38.3%**
**= 0.029 x 0.383**
**= 0.011**


Across 107 developing countries, 1.3 billion people — 22 percent — live in multidimensional poverty.

Niger 2012 D 0.590

| අංශය | බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI) | | |
|---|---|---|---|
| | 2006/07 | 2009/10 | 2016 |
| නාගරික | 0.0087 | 0.0141 | 0.0022 |
| ග්‍රාමීය | 0.0273 | 0.0173 | 0.0085 |
| වතු | 0.0860 | 0.0460 | 0.0433 |
| ශ්‍රී ලංකාව | 0.0272 | 0.0183 | 0.0089 |

මූලය SHDR 2012, DCS 2019

***Distribution of the population and those who are multidimensional poor by urban, rural and estate areas in Sri Lanka***




Source: Household Income and Expenditure Survey, 2019

***National multidimensional poverty statistics***

| | Value | Confidence Interval (95%) | |
|---|---|---|---|
| **NMPI** | 0.067 | 0.062 | 0.071 |
| **Headcount ratio (H, %)** | 16.0 | 15.0 | 17.1 |
| **Intensity (A, %)** | 41.6 | 41.2 | 42.1 |

Source: Household Income and Expenditure Survey, 2019

**Sustainable Development Goals that link to the global Multidimensional Poverty Index**




Source: https://sdgs.un.org/goals.

## ***තිරසාර සංවර්ධනය (Sustainable Development)***

*1987 දී පරිසරය හා සංවර්ධනය සඳහා වූ කොමිසම විසින් ප්‍රකාශයට පත් කරන ලද අපේ පොදු අනාගතය නම් වාර්තාවට අනුව තිරසාර සංවර්ධනය පහත ආකාරයට නිර්වචනය කරඇත*


*Sustainable Development is development that meets the needs of the present without compromising the ability of future generations to meet their own needs ( WCED, 1987; p.43)*

***" අනාගත පරම්පරාවලට තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන ලෙස වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගැනෙන සංවර්ධන ක්‍රියාවලිය තිරසාර (ධරණීය) සංවර්ධනය නම් වේ"***

*ලෝක බැංකුවේ අධ්‍යනයකට අනුව තිරසාර සංවර්ධනය යනු,*

***"මිනිසුන් හමුවේ ඇති අවස්ථා ඉහළ නංවනු වස් සමාජයේ වත්කම් කළමානාකරණය කෙරෙන ක්‍රියාවලියකි"***

# තිරසාර සංවර්ධනය (Sustainable Development)




*1992 වර්ෂයේදී බ්‍රසීලයේ, රියෝ ඩි ජැනෙයිරෝ නගරයේ පැවති මිහිතල සමුළුවේදී තිරසාර සංවර්ධනය පහත පරිදි නිර්වචනය කර ඇත.*

***" ආර්ථික, සමාජීය හා පාරිසරික අංශ අතර සමබරතාව ආරක්ෂා වන ආකාරයට සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීම තිරසාර සංවර්ධනය වේ."***

# තිරසාර සංවර්ධනය

## ආර්ථික පැතිකඩ

- ආර්ථික වෘද්ධිය වේගවත් වීම
- කායර්ක්ෂම ලෙස සම්පත් භාවිතය
- ආර්ථික උච්චාවචනයන් අවම වීම

## සමාජ පැතිකඩ

- සමාජ සාධාරණත්වය (ආදායම් විෂමතා අඩුවීම)
- සමාජ පිරිස් අතර ගැටුම් අඩු වීම
- සමාජ සංවලනය හොඳින් සිදුවීම

## පාරිසරික පැතිකඩ

- සම්පත් වල සුරක්ෂිතතාවය ඇති කිරීම
- පරිසර හානිය වළක්වා ගැනීම
- පරිසරයේ ගුණාත්මකභාවය රැකගැනීම

# චිරස්ථායි සංවර්ධනය (Sustainable Development)

- පාරිසරික සම්පත් භාවිතය මානව සංවර්ධනයට සෘජුවම බලපායි.

- ස්වභාව ධර්මයෙන් ලැබී ඇති මෙම සම්පත් ඉවක් බවකින් තොරව භාවිතා කිරීම නිසා සමස්ත මානව වර්ගයාගේම පැවැත්මට තර්ජනයක් වී ඇති බව මෑත කාලය තුළ අවධානයට යොමු වී ඇති ප්‍රශ්නයකි.

- වායු ගෝලයේ උෂ්ණත්වය ඉහළ යාම, (Global Warming) හිම කඳු දියවීම, දේශගුණ විපර්යාස (Elnino ප්‍රශ්න, හදිසි කුණාටු, ගංවතුර) ඕසෝන් ස්ථරය සිදුරු වීම, වනාන්තර කැපීම, ජලය දූෂණය.

# ධරණීය සංවර්ධනය

- සෑම පරම්පරාවක්ම අවම වශයෙන් තමන් උරුම කරගත් ප්‍රාග්ධන සම්භාරයේ ප්‍රමාණයවත් ඉදිරි පරම්පරාවට හිමිකර දිය යුතුය

- ප්‍රාග්ධන සම්භාරය

  භෞතික ප්‍රාග්ධනය (යන්ත්‍ර සූත්‍ර හා යටිතල පහසුකම්)

  බුද්ධිමය ප්‍රාග්ධන සම්පත් (දැනුම හා තාක්ෂණය)

  පාරිසරික ප්‍රාග්ධනය (ගුණාත්මක තත්වය සහ ස්වාභාවික භාණ්ඩ තොගය)

# තිරසාර සංවර්ධනය අත්කර ගැනීමට අවශ්‍ය කරන කරුණු

- සමාජ සංවර්ධනය - හැමදෙනාගේම අවශ්‍යතාවල වැදගත්කම හඳුනා ගැනීම. වෘද්ධියේ ප්‍රතිලාභ හැමදෙනා අතරම බෙදී යා යුතුය.
- පරිසරය සුරකීම.
- පාරිසරික සම්පත් මැනවින් කළමනාකරණය කිරීම.
- ඉහළ සහ ස්ථාවර ආර්ථික වෘද්ධියක් පවත්වා ගැනීම.

# අපේ ලෝකය වෙනස් කිරීමට තිරසාර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය

■ 2015 සැප්තැම්බර් මස 25 දින රටවල් 195 ක සහභාගීත්වයෙන් තිරසාර සංවර්ධනය උදෙසා 2015 න්‍යාය පත්‍රය පැහැදිලි ගෝලීය ඉලක්ක මාලාවක් සමග සම්මත කර ගන්නා ලදී

එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින්, දිළිඳුකම පිටුදැකීම, ෂෘජීවිතලය රැක ගැනීම සහ සැමට සෞභාග්‍ය උදාකරදීම මූලික කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයෙහි අංගයක් ලෙස 2015 වර්ෂයේ දී තිරසර සංවර්ධන අභිමතාර්ථයන් එළිදක්වන ලදී.

තිරසර සංවර්ධනය සඳහා න්‍යාය පත්‍රය “අපගේ ලෝකය වෙනස් මගකට යොමු කිරීම” ප්‍රකාශනය මගින් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් තිරසර සංවර්ධන අභිමතාර්ථ 17ක් හඳුන්වා දෙන ලද අතර ඒ සඳහා ඉලක්ක 169ක් ද හඳුනා ගන්නා ලදී. එම ඉලක්කයන් ලහාකර ගැනීම මැන බැලීම සඳහා නිර්නායක 244ක් ද මේ වන විට හඳුනාගෙන තිබේ. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල්වල සංවර්ධන න්‍යාය පත්‍රයන් මගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීම අපේක්ෂා කෙරේ.

එමගින් පුළුල් නිදහසක් තුළ විශ්ව සාමය ශක්තිමත් කිරීමට ද අපේක්ෂා කෙරේ.




ජනතාව : සියලු ආකාරයේ දරිද්‍රතාවය සහ කුසගින්න අවන් කිරීම සහ සමානත්වය තහවුරු කිරීම

පෘථිවි තලය : අනාගත පරම්පරාව සඳහා අපගේ පෘථිවි තලයේ ස්වාභාවික සම්පත් සහ දේශගුණය ආරක්‍ෂා කිරීම

සමෘද්ධිය : ස්වභාව ධර්මයට අනුවර්තිත සමෘද්ධිමත්භාවය සහතික කිරීම හා ජීවිතය පරිපූර්ණ කිරීම

හවුල්කාරිත්වය: ප්‍රබල ගෝලීය හවුල්කාරිත්වයක් තුළින් න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම

සාමය : සාමකාමී, යුක්ති සහගත සහ සියල්ලන් ඇතුළත් සමාජයක් පෝෂණය කිරීම

85

# තිරසාර සංවර්ධන අභිමතාර්ථ

## තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17 කි

01. සෑම ස්වරූපයකම දරිද්‍රතාව අවසන් කිරීම.
02. තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කරමින් කුසගින්න නිමා කොට ආහාර සුරක්ෂිතතාව තහවුරු කොට ශේෂ මට්ටම ඉහළ නැංවීම.
03. සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයන්ගේ සෞඛ්‍ය තත්ත්වය උසස් කොට නීරෝගී ජීවිතයක් තහවුරු කිරීම.
04. ගුණාත්මක අධ්‍යාපනයක් සමාන ලෙස සිය ලු දෙනාටම ලබා දීමට සහ සියලු දෙනාටම ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථාව ලබා දීම.
05. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමාන තත්ත්වයක් ඇති කිරීමත් කාන්තාවන් සහ ගැහැණු දරුවන් සවිබල ගැන්වීම.

06. සියලු දෙනාටම ජලය හා සනීපාරක්ෂාව තිරසාර ලෙස ලබා ගත හැකි වීම.
07. නූතන බලශක්තිය සියලු දෙනාටම පහසු මිලට තිරසාර ලෙස ලබා දීම.
08. සර්ව සහභාගීත්ව ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම පූර්ණ හා ඵලදායි රැකියා අවස්ථා ලබා දීම.
09. කාර්යක්ෂම යටිතල පහසුකම් ඇති කිරීම, තිරසාර කාර්මීකරණ ක්‍රියාවලියක් ඇති කිරීම, නව්‍යතාවන් දිරිමත් කිරීම.
10. රටවල් ඇතුළත සහ රටවල් අතර අසමානතාවය අඩු කර ලීම.
11. නගර සහ මානව ජනාවාස ආරක්ෂිත හා තිරසාර ලෙස පවත්වා ගැනීම.

12. පරිභෝජනය සහ නිෂ්පාදනය රටාවන්හි තිරසාර බවක් ඇති කිරීම.

13. දේශගුණික විපර්යාස සහ එමගින් වන හානි වැළැක්වීමට කිසියම් ක්‍රියාමාර්ග ගැනීම.

14. සාගර සම්පත් රැක ගැනීම හා තිරසාර ලෙස උපයෝජනය කිරීම

15. භෞතික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම , ජෛව විවිධත්වය රැක ගැනීම.

16. සාමකාමී හා සර්වසහභාගීත්ව සමාජයක් බිහි කිරීම, යුක්තිය සැමට ඉටු කිරීම වගකීම් සහිත කාර්යක්‍ෂම ආයතන ව්‍යුහයක් ඇති කර ගැනීම.

17. තිරසාර සංවර්ධනය සඳහා ශක්තිමත් ගෝලීය හවුල්කාරීත්වයක් ගොඩ නැගීම.

# සන්තුෂ්ටි දර්ශකය

ලෝකයේ රටවල සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලන හා පාරිසරික සියලුම අංශවල සංවර්ධනය මැන බැලීම සඳහා 2008 වර්ෂයේ දී සන්තුෂ්ටි දර්ශකය හඳුන්වා දී ඇත.

## The 4 Pillars of GNH


**Sustainable & Equitable Socio-Economic Development**

**Environmental Conservation**



**Good Governance**

**Preservation & Promotion Of Culture**




සන්තුෂ්ටි දර්ශකයට ඇතුළත් වන සංරචක :

- යහපාලනය
- පරිසරය
- සංස්කෘතිය
- මානසික සතුට
- කාල කළමනාකරණය
- අධ්‍යාපනය
- සෞඛ්‍යය
- ජීවන තත්ත්වය
- සමාජීය සබඳතා

# විෂය අන්තර්ගතය

## 11.5 දරිද්‍රතා සංකල්පය විග්‍රහ කරමින් එය මිනුම් කරන අයුරු දක්වයි

දරිද්‍රතා සංකල්පය

- අර්ථ දැක්වීම
- දරිද්‍රතාව මැනීම
- ජාතික දරිද්‍රතා ඉම
- ජනගහන දරිද්‍රතා දර්ශකය
- ජාත්‍යන්තර දරිද්‍රතා ඉම
- වෙනත් දරිද්‍රතා දර්ශක
- දරිද්‍රතාවේ ස්වරූප
- නිරපේක්ෂ දරිද්‍රතාව
- සාපේක්ෂ දරිද්‍රතාව
- පැතිකඩ
- පාරිභෝජන දරිද්‍රතාව (ආදායම්)
- මානව දරිද්‍රතාව

## 11.6 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව විමර්ශනයට ලක් කරයි.

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව
- ජාතික දරිද්‍රතා මට්ටම
- ප්‍රාදේශීය සහ ආංශික වෙනස්කම්
- දරිද්‍රතාවට හේතු
- දරිද්‍රතාව අවම කිරිමට ගත හැකි ක්‍රියාමාර්ග

# දරිද්‍රතා සංකල්පය පිළිබඳ නිර්වචන

සංවර්ධන ආර්ථික විද්‍යාවට සම්බන්ධ ආර්ථික විද්‍යාඥයින් මෙන්ම ජාත්‍යන්තර ආයතන විසින් දරිද්‍රතා සංකල්පය විවිධ පැතිකඩ ඔස්සේ අර්ථ දැක්වීම් කර ඇත.

i) දරිද්‍රතාව යනු සුවිභාවයේ විහීනතාවයකි (ලෝක බැංකුව)
(Deprivation in well - being " World Bank 2008)

ii) තෝරාගැනීම් සහ අවස්ථාවන් අත්පත් කර ගැනීමට ඇති නොහැකියාව සහ මානව ගරුත්වය කඩවීම දරිද්‍රතාවයි.
(Denial of choices and opportunities and violation of human dignity - United Nations)

iii) මූලික මානව අවශ්‍යතාවල උග්‍ර විහීනතාවය දරිද්‍රතාවයි.
(සමාජ සංවර්ධනය සඳහා ලෝක සමුළුව)
(Severe deprivation of basic human needs, including food, safe drinking water, sanitation facilities health, shelter, education and information - (World Summit on Social Development)

iv) *අවාසිදායක තත්ත්වයන් සමූහයක් සහිත බහුමාන සංසිද්ධියකි. (Poverty as a multidimensional issue, reflecting clusters of disadvantage - Robert Chambers)*

*රොබර්ට් චෙම්බර්ස් විසින් එකිනෙකට ස්වාධීනවත්, එකිනෙක හා සම්බන්ධ වීමෙනුත් පුද්ගලයන් හා කුටුම්බ දිළිඳුකමෙහි රඳවා තබන පැතිකඩවල් පහක් හ÷නා ගෙන ඇත.*

- (i) *ආදායම් දරිද්‍රතාව (Income Poverty)*
- (ii) *කායික දුබලතාව (Physical Weakness)*
- (iii) *පීඩනයන්ට ගොදුරුවීමේ නැඹුරුතාව (Vulnerability)*
- (iv) *හුදෙකලාවීම (Isolation*
- (v) *බලරහිතභාවය (Powerlessness))*

v) *දරිද්‍රතාව යනු මූලික හැකියා විහීනතාවයකි (Deprivation of basic capabilities - A. K Sen)*

*ඉහත සඳහන් ආකාරයට විවිධ ආයතන හා පර්යේෂකයින් විවිධ නිර්වචන ඇසුරෙන් ඉතා සරළව දක්වතොත්* ***දරිද්‍රතාව යනු පිලිගත හැකි ජීවන මට්ටමක් අත්කර ගැනීමට හේතුවන මූලික අවශ්‍යතා පිරිමසා ගැනීමට නොහැකිවීමයි.***

# දරිද්‍රතාව යනු කුමක්ද?



ප්‍රායෝගිකව,
බොහෝ දැ
නොමැති කමයි.

මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණවත් සම්පත් නොමැති වීම.

## ආදායම් හෙවත් පරිභෝජන දරිද්‍රතාව Income Poverty or Consumption Poverty

*ආදායම හෝ පරිභෝජනය අහිමි වීම පදනම් කරගෙන දරිද්‍රතාව නිර්වචනය කිරීම ආදායම් /පරිභෝජන දරිද්‍රතාව ලෙස අදහස් වේ. මූලික ජීවන අවශ්‍යතා ඇතුළත් අවම පරිභෝජන මට්ටමක් පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් මට්ටමක ආදායමක් උපයා ගැනීමට නොහැකි වීම ආදායම් මූලික දරිද්‍රතාව නම් වේ. එසේම අවම පරිභෝජන මට්ටම යටතේ ආහාර හා ආහාර නොවන පරිභෝජන වියදම් කෙරෙහි අවධානය යොමු කර ඇති නිසා මෙය පරිභෝජන දරිද්‍රතාව ලෙස ද අදහස් කෙරේ.*

## මානව දරිද්‍රතාව (Human Poverty)

*පුද්ගල ජීවිතයේ ගුණාත්මක තත්ත්වයන් විදහා දැක්වෙන වැඩිහිටි සාක්ෂරතාව, ජීවන අපේක්ෂාව, පාසල් අධ්‍යාපනය ලැබූ වර්ෂ ගණන වැනි නිර්ණායක පදනම්ව දරිද්‍රතාව අර්ථ දැක්වීම සහ මිනුම් කිරීම මානව දරිද්‍රතාව යටතේ සිදු කෙරේ. 1997 වර්ෂයේ නිකුත් කරන ලද මානව සංවර්ධන වාර්තාව මගින් මානව දරිද්‍රතා සංකල්පය හ÷න්වා § ඇත.*

*'නිදහස, ආත්ම ගරුත්වය හා අන්‍යයන්ගේ සැලකිල්ල භුක්ති විඳිමින් සෞඛ්‍ය සම්පන්නව හා සතුටුදායක ජීවන තත්ත්වයක් ගත කිරීමට සමත් මානව සංවර්ධනයක් සඳහා ඇති ඉඩ ප්‍රස්ථා හා තේරීම් අහිමි වී ගිය තත්ත්වය මානව දරිද්‍රතාවයයි.*

ආදායම හෝ පරිභෝජනය අහිමි වීම පදනම් කරගෙන දරිද්‍රතාව නිර්වචනය කිරීම ආදායම් දරිද්‍රතාව නම් වේ. යම් කුටුම්භයක හෝ සමාජයක හෝ මූලික අවශ්‍යතා පිරිමසා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් නොමැති වීම ආදායම් දරිද්‍රතාවය යි. ආදායම් හෝ පරිභෝජන දරිද්‍රතාවයේ ප්‍රධාන පැතිකඩ දෙකකි.

i) නිරපේක්ෂ දරිද්‍රතාව (absolute Poverty)

ii) සාපේක්ෂ දරිද්‍රතාව (relative Poverty)

පුද්ගලයෙකුට හෝ කුටුම්භයකට හෝ තම මූලික අවශ්‍යතා සපුරාගැනීමට අවශ්‍ය කරන අවම ආදායම් ප්‍රමාණය නොමැති තත්ත්වය නිරපේක්ෂ දරිද්‍රතාවයයි යම් සමාජයක මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ආදායම් මට්ටමක් නොලැබීම නිසා හටගන්නා දරිද්‍රතාව නිරපේක්ෂ දරිද්‍රතාව වේ.

නිරපේක්ෂ දරිද්‍රතාව මිනුම් කිරීමේ ද භාවිතා කෙරෙන පොදු මිනුම් දණ්ඩ වනුයේ දරිද්‍රතා ආපාතය (Poverty Incidence) හෙවත් දරිද්‍රතා ඉමයි.

ආදායම් හෙවත් පරිභෝජන දරිද්‍රතාවයේ දෙවන පැතිකඩ වන්නේ සාපේක්ෂ දරිද්‍රතාවයි. ජනගහනයේ එක් කොටසකගේ සමාජ ආර්ථික තත්ත්වයන් සමඟ සසඳා බලන විට තවත් කොටසකගේ සමාජ ආර්ථික තත්ත්වයන් සාපේක්ෂ වශයෙන් දිළිඳු යයි හඳුනා ගැනීම සාපේක්ෂ දරිද්‍රතාව වශයෙන් අදහස් වේ.

**සාපේක්ෂ දරිද්‍රතාව හඳුනා ගැනීම සඳහා පහත සඳහන් මිනුම් යොදා ගනී.**

1. කිසියම් රටක මධ්‍යන ආදායමෙන් සියයට 50ක් දරිද්‍රතා රේඛාව වශයෙන් ගෙන ඊට වඩා පහළ ආදායමක් ලබන ජනගහනය හෝ කුටුම්භ හෝ සාපේක්ෂ වශයෙන් දිළිඳු යයි හඳුනා ගැනීම (ලෝක බැංකු විග්‍රහය)


එසේම කිසියම් රටක මධ්‍යන ආදායමෙන් සියයට 60 ක් දරිද්‍රතා රේඛාව වශයෙන් ගෙන සාපේක්ෂ දරිද්‍රතාව හඳුනා ගැනීමට ද උත්සාහ දරා ඇත. (ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානය හා යුරෝපා සංගමයේ විග්‍රහය)

2. ආදායම් උපයන්නන්ගෙන් පහළම සියයට 40 උපයන ආදායම් ප්‍රතිශතය සැලකිල්ලට ගෙන එය සාපේක්ෂ දරිද්‍රතාව පිළිබිඹු කෙරෙන දර්ශකයන් ලෙස භාවිතා කිරීම.

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මනින්නේ කෙසේද?

**දත්ත මූලාශ්‍රය: ආදයම් හා වියදම් සමීක්ෂණය**

**(2002.2006/07,2009/10,2012/13,2016 )**



# මූලික අවශ්‍යතා සඳහා වියදම් ක්‍රමවේදය

නිල දරිද්‍රතා රේඛාව ගණනය කිරීම සඳහා මූලික අවශ්‍යතා සඳහා වියදම් ක්‍රමවේදය යොදා ගන්නා ලදී.

ආහාර දරිද්‍රතා රේඛාව ඇස්තමේන්තු කිරීම → ආහාර නොවන දරිද්‍රතා රේඛාව ඇස්තමේන්තු කිරීම → නිල දරිද්‍රතා රේඛාව ඇස්තමේන්තු කිරීම

කිසියම් පුද්ගලයෙකුගේ මාසික ඒක පුද්ගල පරිභෝජන වියදම නිල දරිද්‍රතා රේඛාවේ අගයට වඩා පහළ නම් එම පුද්ගලයා දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයකු ලෙස සලකයි.

# නිල දරිද්‍රතා රේඛාවේ අර්ථ දැක්වීම

2002 වර්ෂයේ ශ්‍රී ලංකාවේ, මාසික ඒක පුද්ගල මූර්ත පරිභෝජන වියදම (real per capita expenditure per month) **රු.1423** ට අඩු ගෘහ කාණ්ඩයන්හි වෙසෙන පුද්ගලයින් දරිද්‍රතාවයෙන් පෙළෙන්නන් ලෙස හැඳින්වේ.

(i) ජාතික දරිද්‍රතා ආපාතය (ජාතික දරිද්‍රතා රේඛාව)

**official poverty line**
**(Minimum Expenditure per person per month to fulfill the basic needs**

(ii) ජාත්‍යන්තර දරිද්‍රතා ආපාතය (ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව)

**ජාතික දරිද්‍රතා මිනුම් (ජාතික දරිද්‍රතා ආපාතය)**

ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මිනුම් කිරීම සඳහා පහත සඳහන් දර්ශක ප්‍රකාශයට පත් කර ඇත. නිරපේක්ෂ දරිද්‍රතාවයට අදාළව පහත මිනුම් සැලකිල්ලට ගත හැකිය.

i) ජනගහන දරිද්‍රතා දර්ශකය ( Poverty Headcount Index)

දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන දිළිඳු ජනගහනයේ ප්‍රමාණය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම මේ යටතේ සලකා බැලේ. මෙහිදී 2012/13 වසර සඳහා ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති එක් මාසයකට රුපියල් 3,624 ක් වර්ථමාන නිල දරිද්‍රතා රේඛාව පදනම් වේ.

$$\text{ජනගහන දරිද්‍රතා දර්ශකය} = \frac{\text{දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන දිළිඳු ජනගහනයේ ප්‍රමාණය}}{\text{මුළු ජනගහනය}} \times 100$$

ii) දිළිඳු කුටුම්භ ප්‍රතිශතය ( Percentage of Poor Households)

ප්‍රකාශයට පත්කරන ලද දරිද්‍රතා රේඛාවට පහළින් සිටින දිළිඳු කුටුම්භ ප්‍රමාණය මුළු කුටුම්භ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කිරීම දිළිඳු කුටුම්භ ප්‍රතිශතය නම් වේ.

$$\text{දිළිඳු කුටුම්භ ප්‍රතිශතය} = \frac{\text{දරිද්‍රතා රේඛාවට පහළින් සිටින දිළිඳු කුටුම්භ ප්‍රමාණය}}{\text{මුළු කුටුම්භ ප්‍රමාණය}} \times 100$$


# දරිද්‍රතා මිනුම්

ඒක
පුද්ගල
වියදම

නිල දරිද්‍රතා රේඛාව

දිළිඳු නොවන

නිල දරිද්‍රතා රේඛාව 2019 = Rs. 6,966




දිළිඳු

ජනගහන
දරිද්‍රතා
දශර්කය


**14.3%**

ජනගහන දරිද්‍රතා දශර්කය

(නිල දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහන ප්‍රතිශතය)

Figure 01

**Poverty trend by survey period with respect to the current and new poverty lines**




**Source:** Household Income and Expenditure Survey-2019

**Department of Census and Statistics, Sri Lanka**

## ජනගහන දරිද්‍රතා දර්ශකය

| අංශය | 2019 | 2016 | 2012/13 | 2009/10 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | **14.3** | 4.1 | **6.7** | 8.9 |
| නාගරික | **6.0** | 1.9 | **2.1** | 5.3 |
| ග්‍රාමීය | **15.0** | 4.3 | **7.0** | 9.4 |
| වතු | **33.8** | 8.8 | **10.9** | 11.4 |

| Updated poverty line (based 2012/13 on NCPI) | | |
|---|---|---|
| Headcount (%) | Number of poor people | Contribution to total poverty (%) |
| 14.3 | 3,042,300 | 100.0 |
| | | |
| 6.0 | 217,500 | 7.1 |
| 15.0 | 2,500,600 | 82.2 |
| 33.8 | 324,200 | 10.7 |

## දිළිඳු කුටුම්භ ප්‍රතිශතය

| අංශය | 2012/13 | 2016 | 2019 | 2009/10 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | **5.3** | 3.1 | 12.6 | 7.0 |
| නාගරික | **1.5** | 1.3 | 5.0 | 3.8 |
| ග්‍රාමීය | **6.0** | 3.3 | 13.1 | 7.5 |
| වතු | **8.8** | 6.8 | 25.8 | 8.9 |

# පළාත් අනුව දරිද්‍රතාව

| පළාත | ජනගහන දරිද්‍රතා දර්ශකය (%) | |
|---|---|---|
| | 2019 | 2016 |
| බස්නාහිර | 5.7 | 1.7 |
| මධ්‍යම | 18.7 | 5.4 |
| දකුණ | 12.6 | 3.0 |
| උතුර | 23.8 | 7.7 |
| නැගෙනහිර | 18.6 | 7.3 |
| වයඹ | 11.8 | 2.7 |
| උතුරු මැද | 11.0 | 3.3 |
| ඌව | 28.3 | 6.5 |
| සබරගමුව | 23.1 | 6.7 |

| District | Poverty Headcount Index (%) | | | |
|---|---|---|---|---|
| | 2012/13 | 2016 | | 2019 |
| Colombo | 1.4 | 0.9 | | 2.3 |
| Gampaha | 2.1 | 2.0 | | 5.7 |
| Kalutara | 3.1 | 2.9 | | 12.2 |
| Kandy | 6.2 | 5.5 | | 14.3 |
| Matale | 7.8 | 3.9 | | 19.6 |
| Nuwara Eliya | 6.6 | 6.3 | | 26.3 |
| Galle | 9.9 | 2.9 | | 13.2 |
| Matara | 7.1 | 4.4 | | 11.1 |
| Hambantota | 4.9 | 1.2 | | 13.6 |
| Jaffna | 8.3 | 7.7 | | 25.8 |
| Mannar | 20.1 | 1.0 | | 8.0 |
| Vavuniya | 3.4 | 2.0 | | 13.9 |
| Mullaitivu | 28.8 | 12.7 | | 44.5 |
| Kilinochchi | 12.7 | 18.2 | | 26.4 |

| | | | | |
|---|---|---|---|---|
| **Batticaloa** | **19.4** | **11.3** | | **20.8** |
| **Ampara** | **5.4** | **2.6** | | **17.2** |
| **Trincomalee** | **9.0** | **10.0** | | **18.3** |
| **Kurunegala** | **6.5** | **2.9** | | **12.5** |
| **Puttalam** | **5.1** | **2.1** | | **10.5** |
| **Anuradapura** | **7.6** | **3.8** | | **8.1** |
| **Polonnaruwa** | **6.7** | **2.2** | | **17.0** |
| **Badulla** | **12.3** | **6.8** | | **32.3** |
| **Monaragala** | **20.8** | **5.8** | | **21.0** |
| **Ratnapura** | **10.4** | **6.5** | | **24.9** |
| **Kegalle** | **6.7** | **7.1** | | **20.8** |

**ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව නිවැරදිව පිළිබිඹු කිරීම සඳහා වර්තමාන නිල දරිද්‍රතා රේඛාව කොපමණ නිවැරදි මිනුමක් ද** යන්න පිළිබඳ මතවාද පවතී. ඒ අනුව රටේ දරිද්‍රතාව පිළිබඳව නිවැරදි මිනුමක් ලබා ගැනීම සඳහා දැනට භාවිතා කරන ජාතික දරිද්‍රතා රේඛාව යාවත්කාලීන කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. මෙයින් පැහැදිලි වන්නේ වර්තමාන නිල දරිද්‍රතා රේඛාවේ අඩුපාඩු පවතින බවයි. ඒවා පහත ආකාර වේ.

1. රටේ සමස්ත පරිභෝජන රටාව පිළිබිඹු නොවීම.

2016 ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය මත පදනම්ව එක් පුද්ගලයෙකු සඳහා එක් මාසයකට රුපියල් 4,116 ක් වන වර්තමාන නිල දරිද්‍රතා රේඛාවට පදනම් වී ඇත්තේ 2002 වසරේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය මත පදනම්ව ගොඩනගන ලද පරිභෝජන රටාවන්ය. මෙම සමීක්ෂණය සඳහා රටේ සමස්ත ජනගහනයෙන් ආසන්න වශයෙන් සියයට 13 ක් පමණ ජීවත්වන උතුරු හා නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික්ක 8 ආවරණය වී නොමැත. එමනිසා 2002 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය මගින් වර්තමාන පරිභෝජන රටාව පිළිබිඹු නොවන අතරම රටේ සමස්ත පරිභෝජන රටාව ද නියෝජනය නොකෙරේ.

2. නිල දරිද්‍රතා රේඛාව උද්ධමනයට හා ගැලපීමේ දී අඩුපාඩු පැවැතීම.

2002 වසර සඳහා ගණනය කරන ලද නිල දරිද්‍රතා රේඛාව කොළඹ පාරිභෝගික මිල දර්ශකය යොදා ගනිමින් උද්ධමනය හා ගැලපීම මගින් වර්තමානයේ දරිද්‍රතාව මිනුම් කිරීම සඳහා අදාළ නිල දරිද්‍රතා රේඛාව ඇස්තමේන්තු කරනු ලැබේ. කොළඹ දිස්ත්‍රික්කයේ ගෘහ ඒකක වල පරිභෝජන රටාව සහ සිල්ලර මිල ගණන් පදනම් කර ගනිමින් සකස් කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකය මගින් ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශවල පරිභෝජන රටවා සහ සිල්ලර මිල ගණන් නිරූපණය නොවේ.

ලෝක බැංකුව විසින් ලෝකයේ සෑම රටකම නිරපේක්ෂ දරිද්‍රතාව හඳුනා ගැනීම සඳහා පොදු දරිද්‍රතා රේඛාවක් යොදා ගෙන ඇත. එක්සත් ජාතීන් සහ ලෝක බැංකුව ජාත්‍යන්තර සැස£ම් සඳහා එක් පුද්ගලයෙකුට දිනකට ඩොලර් 1 සහ දිනකට ඩොලර් 2 යන ජාත්‍යන්තර දරිද්‍රතා රේඛා භාවිතා කරනු ලැබේ.

මෙම දරිද්‍රතා රේඛාව යොදා ගත් මූල් අවස්ථා වලදී ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව දිනකට එක් පුද්ගලයෙකුට ඩොලර් 1 වශයෙන් 1985 ජාත්‍යන්තර මිල ගණන් යටතේ පිහිටුවන ලදී. නැවත 1993 වසරේ දී ක්‍රය ශක්ති සාම්‍ය මත ගලපන ලද ඇමරිකානු ඩොලරය පාදක කර ගනිමින් දිනකට ඩොලර් 1.08 වශයෙන් ද ප්‍රකාශයට පත්කල අතර නැවත ක්‍රය ශක්ති සාම්‍ය පදනම අනුව ගැලපුම් කොට **2005 මිල ගණන් යටතේ** 2008 වර්ෂය සඳහා ලෝක බැංකුව ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාවේ අගය දිනකට **ඩොලර් 1.25** ක් වශයෙන් යාවත්කාලීන කර ඇත

*The global poverty line is changed from $ 1.25/day in 2005ppp to $ 1.90/ day in 2011ppp (October 2015).*

## ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව

- දිනකට $ 1.00 ක් පැවති ජාත්‍යන්තර දරිද්‍රතා ඉම 2008 දි $ 1.25ක් ලෙස සංශෝධනය කරන ලදී

- ඉන් පසුව රටවල ජීවන වියදම් තත්ත්වයේ වෙනස්කම් සැලකිල්ලට ගෙන 2015 ඔක්තෝම්බර් මාසයේ දි ජාත්‍යන්තර දරිද්‍රතා ඉම $ 1.90 ක් ලෙස සංශෝධනය කරන ලදි

- වර්තමානයේ $ 1.90 අගය 2005 දි $ 1.25 කට සමාන විය

- 2015 දි දරිද්‍රතා ජනගහන ප්‍රමාණය මිලියන 736 ක් විය

*International Poverty Line has a value of US$ 1.90 PPP*

*Lower Middle Income Class Poverty Line has a value of US$ 3.20 PPP*

*Upper Middle Income Class Poverty Line has a value of US$ 5.50 PPP*

*Higher Income Class Poverty Line has a value of US$ 21.70 PPP*